සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026**
**Third Term Test - Grade 13 - 2026**

විභාග අංකය: ..............................

## සාමාන්‍ය පොදු පරීක්ෂණය

කාලය පැය 02 යි

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ කතිර ලකුණ (X) යොදා දක්වන්න.

---

01. වර්තමාන රජය ආරම්භ වීමත් සමඟ ක්ලීන් ශ්‍රී ලංකා (Clean Sri Lanka) ව්‍යාපෘතිය ආරම්භ කර ඒ සඳහා අරමුදලක් පිහිටුවන ලදී. එම අරමුදල ආරම්භ කළ දිනය කුමක් ද?
(1) 2024 නොවැම්බර් 01 (2) 2024 දෙසැම්බර් 01 (3) 2025 ජනවාරි 01
(4) 2025 පෙබරවාරි 01 (5) 2025 අප්‍රේල් 01 (..........)

02. 2017 ඔක්තෝම්බර් මාසයේ දී ලෝකයේ ප්‍රථම වතාවට මිනිස් සිරුරේ ඉරියව් රසකින් සමන්විත ලෝක රූ රැජිනකගේ හැඩරුවට සමාන සොෆියා (Sohia) රොබෝවරිය සඳහා නිල වශයෙන් පුරවැසිභාවය ලබා දෙන ලදී. එලෙස පුරවැසිභාවය ලබා දුන් රට කුමක් ද?
(1) ජපානය (2) චීනය (3) ඇමරිකාව
(4) ඉන්දියාව (5) සෞදි අරාබිය (..........)

03. ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක පදනමක් සහිතව ප්‍රථම නිල ජන සංගණනයක් බ්‍රිතාන්‍ය පාලන සමයේ දී පවත්වන ලදී. එය දකුණු ආසියාතික රටක පවත්වන ලද විද්‍යාත්මක පදනමක් සහිත ප්‍රථම ජන සංගණනය ලෙස ඉතිහාසයට එක් විය. ශ්‍රී ලංකාවේ මෙම ප්‍රථම ජන සංගණනය පැවැත් වූ වර්ෂය කුමක් ද?
(1) වර්ෂ 1815 (2) වර්ෂ 1833 (3) වර්ෂ 1871
(4) වර්ෂ 1905 (5) වර්ෂ 1948 (..........)

04. ශ්‍රී ලංකාව පරිපාලන දිස්ත්‍රික්ක 24 කට හා මැතිවරණ දිස්ත්‍රික්ක 22 කට වෙන්කර ඇත. ඉන් විශාලතම පරිපාලන දිස්ත්‍රික්කය කුමක් ද?
(1) අනුරාධපුරය (2) ගාල්ල (3) ගම්පහ
(4) කුරුණෑගල (5) යාපනය (..........)

05. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාව හඳුන්වන නිල නාමය කුමක් ද?
(1) ශ්‍රී ලංකා ජන රජය (2) ශ්‍රී ලංකා සමාජවාදී ජනරජය
(3) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජය (4) ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ශ්‍රී ලංකාව
(5) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (..........)

06. ශ්‍රී ලංකා සිනමා වංශකථාවේ විශාල සේවාවක් ඉටුකරමින් සිනමාව වෙනස් මානයකට ගෙන ගිය ඔහු සිනමාවේ පියා ලෙස හඳුන්වයි. ඔහු,
(1) ප්‍රසන්න ජයකොඩි මහතා ය. (2) ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා ය.
(3) අමරනාත් ජයතිස්ස මහතා ය. (4) අශෝක හඳගම මහතා ය.
(5) ටයිටස් තොටවත්ත මහතා ය. (..........)

07. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේ කුමන රජ දවස කුමන ස්ථානයක දී ද?
(1) දේවානම්පියතිස්ස රජු, අනුරාධපුරය මහමේව්නා උයනේ දී
(2) වළගම්බා රජු, මාතලේ අලු විහාරයේ දී
(3) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු, මහනුවර දළදා මාළිගාවේ දී
(4) දෙවන බුවනෙකබාහු රජු, දඹදෙණියේ දී
(5) පළමුවන බුවනෙකබාහු රජු, යාපහුව රජමහ විහාරයේ දී (..........)

Scanned with CamScanner

08. පළාත් සභාවක, සභාවේ ප්‍රධානියා සහ පළාතේ ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ නියෝජිතයා වන්නේ,

(1) පළාත් සභා ලේකම්වරයා. (2) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා.
(3) පළාත් ආණ්ඩුකාරවරයා. (4) පළාත් සභාවේ සභාපතිවරයා.
(5) පළාත් තේරීම්බාර නිලධාරිවරයා. (..........)

09. හෙළයේ මහා ගත් කරු මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ සම්මානලාභී නවකතාවක් ඇසුරින් 20 වන සියවසේ මුල් භාගයේ ගාල්ල අවට ගම්මානයක ජීවිතය පසුබිම් කර ගනිමින් 1963 දී තිරගත වූ සිංහල සිනමාවේ සම්භාව්‍ය චිත්‍රපටයක් වන ගම්පෙරළිය චිත්‍රපටය අධ්‍යක්ෂණය කළේ කවුරුන් ද?

(1) ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා. (2) ටයිටස් තොටවත්ත මහතා.
(3) පරාක්‍රම නිරිඇල්ල මහතා. (4) අශෝක හඳගම මහතා.
(5) සෝමවීර දිසානායක මහතා. (..........)

10. ශ්‍රී ලංකාවේ වර්තමාන ටෙස්ට් ක්‍රිකට් නායකයා වන්නේ,

(1) ධනංජය ද සිල්වා (2) කුසල් මෙන්ඩිස් (3) පැතුම් නිශ්ශංක
(4) ඇන්ජලෝ මැතිව්ස් (5) දිනේෂ් චන්දිමාල් (..........)

11. ඉතාලි ජාතික ලියනාඩෝ ඩාවින්චි විසින් නිර්මානය කළ සුප්‍රසිද්ධ 'මොනාලිසා' චිත්‍රය තැන්පත් කර ඇති ලුවර් කෞතුකාගාරය පිහිටා ඇත්තේ කුමන රටේ ද?

(1) ඉතාලිය (2) ග්‍රීසිය (3) ඇමරිකාව
(4) චීනය (5) ප්‍රංශය (..........)

12. ලොව විශාලතම ජාත්‍යන්තර පොලිස් සංවිධානය වන 'ඉන්ටර්පෝල්' (Interpol) ආයතනයේ මූලස්ථානය පිහිටා ඇත්තේ පහත කුමන නගරයේ ද?

(1) ස්විස්ටර්ලන්තයේ ජිනීවා නගරය (2) ප්‍රංශයේ ලියෝන් නගරය
(3) ඇමරිකාවේ නිව්යෝක් නගරය (4) ප්‍රංශයේ පැරිස් නගරය
(5) රුසියාවේ මොස්කව් නගරය (..........)

13. ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය විසින් සංවිධානය කරනු ලැබූ ස්වර්ණ පුස්තක සම්මාන උලලේ දී 2025 වසරේ ස්වර්ණ පුස්තක සම්මානය හිමි වූ කෘතියේ නම කුමක් ද?

(1) පියාසර සමය නවකතාව - චන්ද්‍රරත්න බණ්ඩාර
(2) පරිකර්ම නවකතාව - සුනේත්‍රා රාජකරුණානායක
(3) වාපි නවකතාව - මහින්ද චන්ද්‍රසේකර
(4) සිතේ කෙටුණු දේවනාගර - පි. බී. ජයසේකර
(5) අබාසාන්ති නවකතාව - මනෝහරී ජයලත් (..........)

14. 1987 දී ස්ථාපිත වූ පලස්තීන ඉස්ලාමීය, දේශපාලනික හා සන්නද්ධ සංවිධානයක් වන්නේ පහත කුමන සංවිධානය ද?

(1) තලෙයිබාන් සංවිධානය (2) හිස්බුල්ලා සංවිධානය
(3) අයි එස් අයි එස් (ISIS)සංවිධානය (4) අල්කයිඩා සංවිධානය
(5) හමාස් සංවිධානය (..........)

15. විෂ මත්ද්‍රව්‍ය උවදුර පරදන ජාතික මෙහෙයුම 'රටම එකට' මෙහෙයුමට සමගාමීව දවසේ පැය විසිහතර පුරාම ක්‍රියාත්මක වන ක්ෂණික දුරකථන අංකය කුමක් ද?

(1) 1919 (2) 1990 (3) 1820
(4) 1818 (5) 1800 (..........)

16. සජිත් මහතා ළඟ යම් මුදලක් තිබුණි. ඔහු එයින් හරි අඩක් වියදම් කළ පසු නැවත ඔහුට රු. 20 ක් ලැබුණි. ඉන් පසු එයින් රු. 15 ක් වියදම් කළ විට ඔහු ළඟ ඉතිරි මුදල රු. 40 කි. ඔහු ළඟ මුලින් තිබූ මුදල සොයන්න.

(1) රු. 65 (2) රු. 70 (3) රු. 75
(4) රු. 80 (5) රු. 85 (..........)

Scanned with CamScanner

17. එක්තරා ආහාර වර්ගයක් සකස් කිරීම සඳහා පිටි, සීනි, මාගරීන් 3 : 2 : 1 අනුපාතයට මිශ්‍ර කරයි. මෙම ආහාරවලින් 3 kg සකස් කිරීමට අවශ්‍ය පිටි ප්‍රමාණය කොපමණ ද?

(1) 1 kg (2) 1.5 kg (3) 1.8 kg
(4) 2 kg (5) 2.5 kg (..........)

- ප්‍රශ්න අංක 18 සිට 20 තෙක් ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.

නිමල්, සුනිල්, කමල්, පියල් හා රයන් යන පස්දෙනා පෝලිමක සිටිති. පියල් සිටින්නේ සුනිල්ට ඉදිරියෙනි. නිමල්ට පිටුපසින් සිටින කමල්ට පිටුපසින් පියල් සිටී. රයන් සිටින්නේ පියල්ට පිටුපසින් හා සුනිල්ට ඉදිරියෙනි.

18. පෝලිමේ පිටුපසින් සිටිනේනේ කවු ද?

(1) නිමල් (2) සුනිල් (3) කමල්
(4) පියල් (5) රයන් (..........)

19. පෝලිමේ ඉදිරියෙන් ම සිටින්නේ කවු ද?

(1) නිමල් (2) සුනිල් (3) කමල්
(4) පියල් (5) රයන් (..........)

20. මේ පස්දෙනා අතරින් හරි මැද සිටින්නේ කවු ද?

(1) නිමල් (2) සුනිල් (3) කමල්
(4) පියල් (5) රයන් (..........)

21. සෘජුකෝණාස්‍රයක දිග 10% කින් වැඩිකරන අතර පළල 20% කින් වැඩි කරනු ලැබේ. සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය වැඩි වීමේ ප්‍රතිශතය කොපමණ ද?

(1) 20% (2) 25% (3) 30%
(4) 32% (5) 40% (..........)

22. ○○○ = □□□□□□ සහ □□ = △△△△ වේ. ○○ තුල්‍ය වන්නේ △ කීයකට ද?

(1) 2 (2) 3 (3) 4
(4) 6 (5) 8 (..........)

- **23 සිට 25 තෙක් ප්‍රශ්න පහත ප්‍රකාශ මත පදනම් වේ.**

P, Q, R, S හා T, යනු පූර්ණ සංඛ්‍යා 5 කි. $\sqrt{R} = P$ ද, $S = 2Q$ ද, $P + S = 34$ හා $P + Q = 20$ වේ.

23. S හි අගය වන්නේ,

(1) 36 (2) 28 (3) 14
(4) 6 (5) 2 (..........)

24. P හි අගය වන්නේ,


(1) 36 (2) 28 (3) 14
(4) 6 (5) 2 (..........)

25. R හි අගය වන්නේ,

(1) 36 (2) 28 (3) 14
(4) 6 (5) 2 (..........)

26. රූපයේ දී ඇති පතරම භාවිතයෙන් නිර්මාණය කළ හැකි ඝනකයෙහි එකිනෙකට ප්‍රතිවිරුද්ධ මුහුණත්වල දැකිය හැක්කේ පහත කුමන යුගලය ද?


(1) ★ සහ ○
(2) ★ සහ □
(3) △ සහ ⊞
(4) △ සහ □
(5) ◇ සහ □



(..........)

Scanned with CamScanner

- 27 හා 28 ප්‍රශ්න පහත වෙන් රූපසටහන් මත පදනම් වේ. එක් එක් ප්‍රකාශයට ගැළපෙන වෙන් රූපය තෝරන්න.




27. කාන්තාවන්, මවුවරුන්, තරුණ දරුවන් සිටින මවුවරුන්,

(1) A (2) B (3) C
(4) D (5) E (..........)

28. පැලඳුම්, හිස්වැසුම්, මුව ආවරණ,

(1) A (2) B (3) C
(4) D (5) E (..........)

- 29 හා 30 ප්‍රශ්න පහත මැජික් කොටුව මත පදනම් වේ.

5 සිට 20 තෙක් සංඛ්‍යා එක්වරක් පමණක් යොදාගෙන සෑම පේළියක්, තීරයක් හා විකර්ණයක් ඔස්සේ සංඛ්‍යාවල එකතුව නියත වේ.

29. A හි අගය සොයන්න.

(1) 12
(2) 13
(3) 14
(4) 18
(5) 19 (..........)

| | | | |
|---|---|---|---|
| C | | B | |
| 16 | 10 | | |
| | A | 15 | 9 |
| 17 | | | 20 |

30. B + C හි අගය සොයන්න.


(1) 20 (2) 21 (3) 22
(4) 23 (5) 24 (..........)

- 31 හා 32 ප්‍රශ්න පහත දුර කාල ප්‍රස්තාරය මත පදනම් වේ.

එක්තරා දුම්රියක් A නගරයේ සිට D නගරය තෙක් ගමන් කළ ආකාරය දැක්වෙන දුර හා කාලය අතර සම්බන්ධය ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත.

31. මෙම දුම්රිය පළමු පැය දෙක තුළ ගමන් කළ වේගය සොයන්න.

(1) $25\ kmh^{-1}$
(2) $40\ kmh^{-1}$
(3) $50\ kmh^{-1}$
(4) $80\ kmh^{-1}$
(5) $100\ kmh^{-1}$ (..........)





32. මෙම දුම්රිය නතර වී සිටි කාලය සොයන්න.

(1) පැය ½ (2) පැය 1 (3) පැය 2
(4) පැය 4 (5) පැය 6 (..........)

AL අපි

Scanned with CamScanner

- 33 හා 34 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත දැක්වෙන සංඥා පදනම් කර ගන්න.



A B C D E F

33. A සිට D දක්වා දී ඇති ඒවා එම අනුපිළිවෙළට ම නිරූපණය කරන සංඥාවලට අනුරූප ඉංග්‍රීසි අක්ෂර පෙළගස්වන්න.

A - මිනිසුන් වැඩෙහි යෙදෙන ස්ථානය ඉදිරියෙන්
B - අන්ධ පුද්ගලයන් පාර හරහා මාරුවෙන ස්ථානය ඉදිරියෙන්
C - බෝක්කු හෝ පටු පාලම ඉදිරියෙන්
D - ගේට්ටුව සහිත දුම්රිය මාර්ගය ඉදිරියෙන්

(1) D, B, C, A (2) D, B, A ,C (3) D, A, B, C
(4) A, B, C, D (5) D, C, B, A (..........)

34. පදිකයන් මාර්ගය හරහා මාරුවන ස්ථානයක් හා සමීපයේ පාසලක් හෝ ක්‍රීඩා පිටියක් ඇති බව දැක්වෙන සංඥා දෙක මොනවා ද?

(1) E හා F (2) F හා E (3) E හා B
(4) B හා E (5) E හා D (..........)

- 35, 36 ප්‍රශ්න පහත ඡේදය මත පදනම් වේ.

පුරෝකතනයන්ට අනුව 2030 වර්ෂයේ දී අපේ රටේ ජනගහනයෙන් සෑම පස්දෙනෙකුගෙන් එක් අයෙක් ම වයස අවුරුදු 60 ඉක්මවූවකු වනු ඇත. මේ ජනගහන පරිවර්තනයට අනුව ආසියාවේ වැඩියෙන් ම මහලු ජනගහනයක් ඇති රට බවට පත්වන්නේ ශ්‍රී ලංකාවයි. රටක ජනගහනයේ සුවසෙත වෙනුවෙන් එම රට සිදුකරන කැපවීම ඉහළ යන තරමට ම මේ ආකාරයෙන් වෘද්ධ ජනගහනය වැඩි වෙයි. මේ නිසා අමතර ගැටලු පැන නැගුනත් සැබැවින් ම එය දියුණු සෞඛ්‍ය සේවාවක ලක්ෂණයක් ම වන්නේ ය. ප්‍රායෝගිකව අපේ රටේ සෞඛ්‍ය සේවාව ප්‍රවර්ධනයට ලක්ව ඇති බවටත් ගුණාත්මක ඉහළ මට්ටමකට පැමිණ ඇති බවටත් මේ ජනගහන පරිවර්තනයට සාක්ෂි සපයයි.

35. ඉහත ඡේදයෙහි සෘජුවම ප්‍රකාශ නොවන අදහස කුමක් ද?

(1) ශ්‍රී ලංකාව අනාගතයේ දී වැඩිහිටි ජනගහනය වැඩි රටක් බවට පත්වේ.
(2) සෞඛ්‍ය පහසුකම් වැඩිවන විට ආයු කාලය දීර්ඝ වේ.
(3) වෘද්ධ ජනගහනය වැඩිවන විට ගැටලු මතු වේ.
(4) ආසියාවේ දියුණුතම සෞඛ්‍ය සේවාව පවතින්නේ ශ්‍රී ලංකාවේය.
(5) වෘද්ධ ජනගහනය වැඩිවීම ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාවේ දියුණුව පෙන්වන එක් සාධකයකි. (..........)

36. ඉහත ඡේදයෙන් සෘජුවම ප්‍රකාශ වන අදහස කුමක් ද?

(1) වයස අවුරුදු 60 ඉක්මවූවන්ට සෞඛ්‍ය පහසුකම් සැපයීම ගැටලුවකි.
(2) 2030 න් පසු වෘද්ධ ජනගහනය නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික ගැටලු ඇති වේ.
(3) අනාගතයේ දී ශ්‍රී ලංකාවේ රෝහල් සංඛ්‍යාව වැඩි කිරීමට සිදු වේ.
(4) වෘද්ධ ජනගහනය නඩත්තු කිරීමට කැපකිරීම් කළ යුතු යි.
(5) සෞඛ්‍ය සේවාව දියුණු හා ව්‍යාප්ත වීම වෘද්ධ ජනගහනය වැඩිවීමට හේතු වේ. (..........)

37. ප්‍රකාශ 03 කින් සමන්විත කෙටි ඡේද පහක් පහතින් දක්වා ඇත. ඒවා අතරින් සිදුවීම්වල වඩාත් පිළිගත හැකි අනුක්‍රමය සහිත ඡේදය තෝරන්න.

(1) ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොමැති විට ජල විදුලිය නිපදවීම දුෂ්කරවේ. සූර්යය ශක්තියෙන් විදුලිය නිපදවිය හැකි ය. ශ්‍රී ලංකාවට වසර පුරාම හොඳින් සූර්යාලෝකය ලැබේ.
(2) සුමිත් පා පන්දු ක්‍රීඩාවට කැමැත්තක් දක්වයි. සුමිත් පාසල් පාපන්දු කණ්ඩායමේ සාමාජිකයෙකි. සුමිත්ගේ යහළුවා සනත් ක්‍රිකට් ක්‍රීඩා කරයි.
(3) රජයේ කාර්යාලවල ස්ථාවර දුරකථන ඇත. ජංගම දුරකථන ද ප්‍රයෝජනවත් උපකරණයකි. විවිධ වර්ගයේ දුරකථන වෙළඳපොළේ ඇත.
(4) බෝග වගාවන් සඳහා කෘෂි රසායනික බහුලව භාවිත කරයි. රජරට ප්‍රදේශයේ වකුගඩු රෝගය ව්‍යාප්ත වෙමින් පවතියි. රජය විසින් එළවළු ආනයනය නොකරයි.
(5) ගුණාත්මක බවින් යුත් ආහාරවල මිල ඉහළ වේ. ගුණාත්මක බවින් යුත් ආහාර වර්ග නිෂ්පාදනය ස්වයං රැකියාවක් ලෙස පවත්වාගෙන යා හැකිය. ආහාර නිෂ්පාදනය සඳහා රජය ණය පහසුකම් ලබා දෙයි. (..........)

Scanned with CamScanner

38. අනුපිළිවෙළක් නැති කුඩා ඡේද 05 ක් පහත දක්වා ඇත. නැවත පිළිවෙළකට සකස් කළ විට සිදුවීම් අනුපිළිවෙලක් දක්වන ඡේදය තෝරන්න.

(1) අමරනාත් දක්ෂ වොලිබෝල් ක්‍රීඩකයෙකි. අමරනාත් විදේශ සංචාරයක් බලාපොරොත්තු වේ. ඔහුගේ පියා ක්‍රීඩා පුහුණුකරුවෙකු ලෙස සේවය කරයි.

(2) ප්‍රියන්ති පාසල් වේලාවෙන් පසු අතිරේක පංති සඳහා සහභාගි වෙයි. ප්‍රියන්ති පාසල් පැමිණෙන්නේ පියා සමඟ මෝටර් රථයෙනි. ප්‍රියන්තිගේ සොයුරිය ගුරුවරියකි.

(3) අමාලි අ. පො. ස. (උ. පෙළ) විභාගය සමත් වී ඇත. ඇය ඉතාමත් සතුටින් සිටියි. අමාලිගේ මව මේ බව දුරකථනයෙන් ඇයට දැනුම් දුන්නේ ය.

(4) දීපිකාගේ මව අසනීපයෙන් සිටියි. දීපිකා මෙවර අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටියි. දීපිකාගේ මවගේ සහෝදරිය ඇයගේ නිවසට පැමිණ ඇත.

(5) සහන් අසතුටින් සිටියි. සහන්ගේ සහෝදරයා නව පාසලකට ඇතුළත් කර ඇත. සහන්ගේ යහළුවා පාසල් පැමිණ නැත. (..........)

- 39 හා 40 යන ප්‍රශ්න පහත ඡේදය මත පදනම් වේ.

ශ්‍රී ලංකාවේ ඉහළ තාක්ෂණික උපකරණ භාවිත කරන මහ රෝහල් විශාල ප්‍රමාණයක් පවතී. රෝගීන්ගේ රෝගාබාධවලට හේතු සොයා බැලීම සඳහා භෞතික මිනුම් ලබාගැනීමට මෙම උපකරණ භාවිත වේ. ක්‍රමානුකූලව සිදු කරනු ලබන භෞතික මිනුම්වලට උස සහ බර, ශරීර උෂ්ණත්වය, රුධිර පීඩනය සහ ECG ඇතුළත් වේ. රෝගීන්ගේ භෞතික මිනුම් නිරෝගී පුද්ගලයන්ගේ භෞතික මිනුම් සමඟ සන්සන්දනය කර, රෝගාබාධ අනාවරණය කර ගැනීමට තොරතුරු ලබා ගැනේ.

39. ඡේදය සවිස්තරාත්මකව ප්‍රකාශ කර ඇත්තේ,

(1) තාක්ෂණික උපකරණ පිළිබඳවය.

(2) රෝගවලට හේතු අනාවරණය කර ගැනීම පිළිබඳවය.

(3) භෞතික මිනුම් පිළිබඳවය.

(4) රෝගවල භාවිත කරන තාක්ෂණය පිළිබඳවය.

(5) සෞඛ්‍යමත් පුද්ගලයන්ගෙන් ලබා ගන්නා තොරතුරු පිළිබඳවය. (..........)

40. ඡේදයේ දක්වා ඇති භෞතික මිනුම්වලින් ඉහළ තාක්ෂණික උපකරණය භාවිත කරන්නේ කුමක් සඳහා ද?

(1) ECG (2) උෂ්ණත්වය (3) රුධිර පීඩනය

(4) බර (5) උස (..........)

- 41, 42, 43 ප්‍රශ්න මගියෙකු, Pickme රථ අයිතිකරුවකු හා රියදුරකු අතර ඇති වූ දුරකථන සංවාදයක් අනුපිළිවෙළක් රහිතව පහත දක්වා ඇත.

A - මහත්මයා, ACS pickme කුලී රථයක් වෙන්කර ගත්ත ද?

B - ඔව්.

C - මම No 151, ඩෙස්මවුන්ට් පාර්ක්, දෙවන පටුමග, මාවතගම. මට සවස 3.00 ට කුරුණෑගල යන්න ඕන.

D - ඔබේ තොරතුරු ලියාපදිංචි කර ඇත. අපේ රියදුරා හැකි ඉක්මනින් ඔබව සම්බන්ධ කර ගනී.

E - මම ''ජනිත්'' ACS Pickme රථ සේවයෙන්, මම නියම වේලාවට ඔතනට එනවා.

F - ඔබ ACS Pickme කුලීරථ සේවයෙන් ද?

G - ඔව් මහත්මයා, මට ඔබේ ලිපිනය, ගමනාන්තය හා අවශ්‍ය වේලාව දැනගන්න පුළුවන් ද?

H - මහත්මයා මම ජනිත්, ඔබේ ගේට්ටුව අසල ඉන්නේ.

I - මම ටික වේලාවකින් එනවා කරුණාකර ඉන්න.

J - ස්තුතියි.

41. මගියා හා කුලී රථ හිමිකරු අතර සංවාදය දැක්වෙන ප්‍රකාශ අනුපිළිවෙල වන්නේ,

(1) FGDCJ (2) FGCDJ (3) FDCGJ

(4) EFGDJ (5) EFDGJ (..........)

Scanned with CamScanner

42. මහියා හා කුලී රථ රියදුරු අතර සංවාදයේ දැක්වෙන ප්‍රකාශ අනුපිළිවෙල වන්නේ,


(1) ABEHI (2) ABHEI (3) ABHIJ
(4) AEHIJ (5) AHEIJ (..........)

43. වඩාත් තර්කානුකූල අනුපිළිවෙල වන්නේ,

(1) ABCDEJHIFG (2) ABCDEJFGHI (3) FGCDABEHIJ
(4) FGCDJABEHI (5) FGCDABEJHI (..........)

- 44, 45 ප්‍රශ්න දී ඇති රූප සටහන්වල එකක් හැර අන් සියල්ලෙහිම පොදු ලක්ෂණයක් දැකිය හැකිය. එම පොදු ලක්ෂණයෙන් බැහැර වූ රූපය තෝරන්න.

44.



(1) (2) (3) (4) (5) (..........)


45.



(1) (2) (3) (4) (5) (..........)

- 46 ප්‍රශ්නය පහත රූප සටහන මත පදනම් වේ. 2025 වර්ෂයේ දී එක්තරා මූල්‍ය ආයතනයක විවිධ වර්ගවලින් ලැබීම් පහත දැක්වේ.

2025 වර්ෂයේ මුළු ලැබීම් ඩොලර් මිලියන ආසන්න වශයෙන් 60 කි.




46. මෙම මූල්‍ය ආයතනය ලැබීම් වලින් ආසන්න වශයෙන් කොපමණ ප්‍රමාණයක් කල්බදු පොලී වශයෙන් ලැබුනේ ද?

(1) ඩොලර් මිලියන 12
(2) ඩොලර් මිලියන 14
(3) ඩොලර් මිලියන 15
(4) ඩොලර් මිලියන 18
(5) ඩොලර් මිලියන 20 (..........)

- 47 හා 48 ප්‍රශ්න පහත දී ඇති විස්තරය මත පදනම් වේ.

පන්සලේ දායක සභාවේ කමිටු සාමාජිකයන් අනිල්, නිශාන්ති, තුසුන්, [illegible] හා සඳුනි ය. මෙම කමිටුව සභාපති, ලේකම් භාණ්ඩාගාරික, කැඳවුම්කරු හා [illegible] යන තනතුරුවලින් සමන්විත ය. පසුගිය වාර්ෂික මහ සභා රැස්වීමේ දී [illegible] හිමි තනතුර [illegible] වෙන් ම තනා තලේ භාණ්ඩාගාරික ය. අනිල් කැඳවුම්කරු [illegible] අවුරුද්දේ තනා තලේ ය.

47. මෙම කමිටුවේ ලේකම් තනතුර දරන්නේ

(1) සඳුනි ය. (2) අනිල් ය. (3) නිශාන්ති ය.
(4) තුසුන් ය. (5) [illegible] (..........)

48. මීට අමතරව නිමන්ති සහ ඔබේසේකර යන දෙදෙනා ම සඳුනිට වඩා අඩුවෙන් කතා කළේ නම් සභාපති තනතුර දරන්නේ,

(1) සඳුනි ය. (2) අනිල් ය. (3) නිමන්ති ය.
(4) කසුන් ය. (5) ඔබේසේකර ය. (..........)

- පහත ප්‍රශ්නයේ නිගමනයක් ද I, II, III ලෙස නම්කරන ලද තොරතුරු කාණ්ඩ තුනක් ද දී ඇත.
  - ★ තොරතුරු කාණ්ඩ තුනෙන් එක් කාණ්ඩයකින් පමණක් නිගමනයට එළඹිය හැකි නම් A තෝරන්න.
  - ★ තොරතුරු කාණ්ඩ I හා II එකවර භාවිතයෙන් නිගමනයට එළඹිය හැකි නම් B තෝරන්න.
  - ★ තොරතුරු කාණ්ඩ I හා III එකවර භාවිතයෙන් නිගමනයට එළඹිය හැකි නම් C තෝරන්න.
  - ★ තොරතුරු කාණ්ඩ II හා III එකවර භාවිතයෙන් නිගමනයට එළඹිය හැකි නම් D තෝරන්න.
  - ★ තොරතුරු කාණ්ඩ I, II, III එකවර භාවිතයෙන් නිගමනයට එළඹිය හැකි නම් E තෝරන්න.

49. නිගමනය: 2025 වර්ෂයේ නොවැම්බර් මස ඇති වූ දිට්වා සුළි කුණාටුවත් සමග මහ වැසි ඇති වී දිස්ත්‍රික්ක බොහෝමයක් නායයාමෙන් බරපතල ලෙස විපතට පත්විය.


(i) 2025 වර්ෂයේ නොවැම්බර් මස ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශවලට පැය 24 උපරිම 350mm ඉක්ම වූ වර්ෂාපතනයක් ලැබුණි.

(ii) 2025 නොවැම්බර් මස හටගත් දිට්වා සුළි කුණාටු වර්ෂාවලින් කෑගල්ල, රත්නපුර, කළුතර, බදුල්ල, මහනුවර හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක තදබල ලෙස විනාශයට පත්විය.

(iii) 2025 වර්ෂයේ නොවැම්බර් මස ඇති වූ වර්ෂාව හේතුවෙන් 2025 වර්ෂයේ මුල් මාසවල රටතුළ පැවති උණුසුම් තත්වය පහව ගියේ ය.

(1) A (2) B (3) C
(4) D (5) E (..........)

50. පහත දැක්වෙන පින්තූර මඟින් කිසියම් සිද්ධියක් නිරූපණය කරයි. එම පින්තූරවල අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.




(1) D B E C F A (2) C A F D E B (3) D E B C A F
(4) D E A B C F (5) E B C A F D (......)

Scanned with CamScanner